පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## කතෝලික ධර්මය

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..........................................

........................................................................................................................ කාලය : පැය 02 යි.

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දක්ෂ ලේඛකයෙකි, ඉතිහාසඥයෙකි, වෛද්‍යවරයෙකි, ශුභාරංචියක් ලියන ලද විජාතිකයා හෙවත් අන්‍ය ජාතිකයා වේ. මෙම කරුණුවලින් හැඳින්වෙන්නේ,
    (1) ශුද්ධ වූ මාක් තුමා ය. (2) ශුද්ධ වූ ජොහාන් තුමා ය.
    (3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ පාවුලු තුමා ය.

02. ''මා මෙය දැනගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාව ද වයස්ගතව සිටී.'' මෙම වදන් දේවදූතයාට පවසන ලද්දේ,
    (1) ආබ්‍රහම් විසිනි. (2) ජොහාන් විසිනි. (3) සෙකරියස් විසිනි. (4) ජෝශප් විසිනි.

03. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) ලූක්තුමා ශුද්ධ වූ පාවුලු තුමා සමඟ එක්ව ක්‍රියා පොත ලියා ඇත.
    (2) ලූක් ශුභාරංචිය ලියූ ලූක් තුමා ජුදා ජාතිකයෙකි.
    (3) ලූක් තුමා දක්ෂ ලේඛකයෙකි. එතුමා අන්‍ය ජාතිකයන් වෙනුවෙන් ශුභාරංචිය ලියා ඇත.
    (4) ලූක් තුමා ශුභාරංචිය සම්පාදනය කර ඇත්තේ ක්‍රි.ව. 60 - 80 අතර කාලයේ ය.

04. ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳ ශුභාරංචියට ඇතුළත් කර ඇත්තේ,
    (1) ශුද්ධවූ පාවුලු තුමා හා ශුද්ධවූ ලූක් තුමා ය. (2) ශුද්ධවූ මතෙව් තුමා හා ශුද්ධවූ ලූක් තුමා ය.
    (3) ශුද්ධවූ ජුවාම් තුමා හා ශුද්ධවූ ලූක් තුමා ය. (4) ශුද්ධවූ මාක් තුමා හා ශුද්ධවූ ලූක් තුමා ය.

05. නැති වූ බැටළුවෙකු සොයා යන එඬේරෙකු ලෙස ජේසුස් වහන්සේ පව්කාරයින් සොයා යන ආකාරය දැක්වෙන උපමාව මගින් අපට පැහැදිලි කරන්නේ,
    (1) අන්‍ය ජාතිකයන්ගේ ශුභාරංචිය යි. (2) දයාවේ ශුභාරංචිය යි.
    (3) යාච්ඤාවේ ශුභාරංචිය යි. (4) ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය යි.

06. වපුරන්නාගේ උපමාවේ කටු අතර වැටුණු බීජ යන්නෙන් අදහස් කර ඇත්තේ,
    (1) දේව වචනය සිත නමැති කෙතෙහි වැපුරූ නමුදු යක්ෂයා විසින් ගත් බව යි.
    (2) දේව වචනය පිළිගත්ත ද පරීක්ෂා කාලයේ දී දේව වචනය අමතක කර කටයුතු කරන අය යි.
    (3) දේව වචනය පිළිගෙන ඒ අසා පිළිපැද පසුබට නොවී උත්සාහයෙන් ඵල දරන අය යි.
    (4) දේව වචනය අසා ජීවිතයේ මුහුණපාන දුක් කම්කටොලු ද වස්තුවෙන් ද ඉඳුරන් පිනවීමෙන් ද දේව වචනය යටපත් වීම නිසා කෙතෙන් ඵල නොදරන බව යි.

07. ස්නාවක ජුවාම් තුමා පොලොං වංශය යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලැබුවේ,
    (1) ගුරුවරුන්ට ය. (2) ප්‍රභුවරුන්ට ය. (3) වැඩිහිටියන්ට ය. (4) ආගන්තුකයින්ට ය.

Education NCP - www.edncp.lk

08. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලද්දේ,

(1) පාස්කු ඉරුදින ය. (2) ආලේලූයියා සෙනසුරාදා ය.

(3) මහ සිකුරාදා ය. (4) මහ බ්‍රහස්පතින්දා ය.

09. මන්නා භෝජනය යනු,

(1) කාන්තාරයේ කුසගින්නෙන් සිටි ඉශ්‍රායෙල් ජනයාට දෙවියන් වහන්සේ දුන් භෝජනය යි.

(2) පොරොන්දු දේශයට යාම සිහි කිරීමට ඉශ්‍රායෙල් ජනතාව වසරක් පාසා කරන ලද භෝජනය යි.

(3) මෙල්කිසදෙක් පූජකතුමා විසින් ප්‍රථම වරට පූප සහ මිදියුෂ දෙවියන් වහන්සේට ඔප්පු කිරීමේ යාගය යි.

(4) ජේසුස් වහන්සේ විසින් පන්දහසකට පූප බෙදා දීමේ ප්‍රාතිහාර්යය යි.

10. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට දිව්‍ය පූජාව ආරම්භයේ දී සුළු පව්වලට මනස්ථාප වීම අවශ්‍ය වේ.

(2) අවම වශයෙන් පැයක්වත් සියලු ආහාරවලින් වැලකී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතුය.

(3) රෝගීන්ට හෝ මහලු අයට උපස්ථාන කරන අයට ද පැයක නිරාහාරශීලීව සිටීම අවශ්‍ය වේ.

(4) රෝගී හෝ මහලු අයට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට නිරාහාරශීලීව සිටීම අවශ්‍ය නොවේ.

- **පහත ප්‍රකාශ කා විසින් කා හට කියන ලද්දක්දැයි ලියන්න.**

11. '' මන්ද සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය.''

............................................................................................................................................

12. '' බිය නොවන්න. මන්ද ඔබේ යාච්ඤාව අසනු ලැබීය. ඔබේ බිරිඳ වන එළිසබෙත් ඔබගෙන් පුතෙකු ලබන්නීය. ඔහුට ජොහාන් යයි. නම් තබන්න.''

............................................................................................................................................

13. '' ස්නාවක ජොහාන්ගේ හිස තැටියක ලා මෙහි දී මට දුන මැනව''

............................................................................................................................................

14. '' මාගේ අසල්වැසියා කවරෙක්ද?''

............................................................................................................................................

15. '' විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ. සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය.''

............................................................................................................................................

Education NCP - www.edncp.lk

- **වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(තුනකි/ සමාරිය/ සිමියොන්/ දේවාත්මානුභාවය/ සකේවුස්)

16. ...................................................... නම් දිවැසිවරයා ජේසුස් වහන්සේ විජාතීන්ට එළිය දෙන ආලෝකය බව ප්‍රකාශ කළේ ය.

17. ජෙරුසලමේ සිට ජෙරිකෝවට යන මිනිසාට සොරු පහර දී වස්ත්‍ර පැහැරගෙන තලා පෙළා ගිය විට ඔහුට දයාව දැක්වූයේ ........................................................... ජාතික මිනිසෙකි.

18. ............................................. පව්කරුවෙකු ලෙස සලකා කොන් කරනු ලැබූවත්, ජේසුස් වහන්සේ ඔහු යහමගට ගත් සේක.

19. පොළොව හිස්ව පාළුව තිබිණි. මහ සයුර මත අන්ධකාරයක් විය. ........................................................... ජලය මතුපිට හැසිරුණේ ය.

20. දේව වන්දනාවේ ප්‍රධාන අංග ..........................................................

(ලකුණු 2X20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ශුද්ධ වූ පාවුලුතුමාගේ මිත්‍රයෙකු ලෙස ශුද්ධ වූ ලූක් තුමාව හඳුන්වා දී ඇති ග්‍රන්ථ **හතරක්** ලියන්න.
(ii) ලූක් ශුභාරංචිය සඳහා යෙදෙන වෙනත් නම් **හතරක්** ලියන්න.
(iii) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග **හතර** නම් කරන්න.
(iv) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ **හතරක්** ලියන්න.
(v) අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් **හතරක්** ලියන්න.

(ලකුණු 4X5=20)

02. (i) ගැලවීමේ ඉතිහාසය සූදානම් කිරීමට දෙවියන් වහන්සේ තෝරා ගත් පළමු පුද්ගලයා නම් කරන්න. (ලකුණු 02)
(ii) මෙසියස් වහන්සේ පිළිබඳ දිවැසි වැකි ඉදිරිපත් කළ දිවැසිවරු **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03)
(iii) පාසල තුළ ශිෂ්‍ය නායකයකු ලෙස ඔබට කැඳවීමක් ලැබුණු විට දේව දරුවකු සේ ක්‍රියා කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) ස්නාවක ජොහාන් තුමාගේ දූත කාර්යය කුමක්ද? (ලකුණු 02)
(ii) ස්නාවක ජොහාන් තුමා දේශනා කළ පුද්ගල කණ්ඩායම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
(iii) ස්නාවක ජොහාන් තුමාගේ දේශනයට අනුව පාසල තුළ ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය ලෙස සැලකෙන ප්‍රසාද නිධානය කුමක්ද? (ලකුණු 02)
(ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික සූදානම හා ශාරීරික සූදානය කෙසේ විය යුතුදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. (i) ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ අපෝස්තුළුවරුන් තුළ ඇති වූ වෙනස්කමක් ලියන්න. (ලකුණු 02)
(ii) පුරාණ ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන් සඳහා භාවිත වන නම් **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය ලැබූවන්ගේ යුතුකම් **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) ශුද්ධ වූ ත්‍රිත්වය ප්‍රකාශ වූ අවස්ථාවක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා **තුන** ලියන්න. (ලකුණු 03)
(iii) ඒක දේව විශ්වාසයට විරුද්ධව සිදුවන ක්‍රියා **පහක්** නම් කර ඒවායින් මිදීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග ලියන්න. (ලකුණු 06)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
08

# දෙවන වාර පරීක්ෂණය - 2019
## කතෝලික ධර්මය
## පිළිතුරු පත්‍රය

### I කොටස

01. (3) ශුද්ධ වූ ලූක් තුමා ය.
02. (3) සෙකරියස් විසිනි.
03. (3) ලූක් තුමා දක්ෂ ලේඛකයෙකි. එතුමා අන්‍ය ජාතිකයන් වෙනුවෙන් ශුභාරංචිය ලියා ඇත.
04. (2) ශුද්ධවූ මතෙව් තුමා හා ශුද්ධවූ ලූක් තුමා ය.
05. (2) දයාවේ ශුභාරංචිය යි.
06. (4) දේව වචනය අසා ජීවිතයේ මුහුණපාන දුක් කම්කටොලු ද වස්තුවෙන් ද ඉදුරන් පිනවීමෙන් ද දේව වචනය යටපත් වීම නිසා කෙතෙන් ඵල නොදරන බව යි.
07. (2) ප්‍රභූවරුන්ට ය.
08. (4) මහ බ්‍රහස්පතින්දා ය.
09. (1) කාන්තාරයේ කුසගින්නෙන් සිටි ඉශ්‍රායෙල් ජනයාට දෙවියන් වහන්සේ දුන් භෝජනය යි.
10. (3) රෝගීන්ට හෝ මහලු අයට උපස්ථාන කරන අයට ද පැයක නිරාහාරශීලීව සිටීම අවශ්‍ය වේ.
11. දේව දූතයා විසින් ජුසේ තුමාට
12. ස්වාමීන් වහන්සේගේ දූතයා විසින් සෙකරියස් තුමාට
13. හෙරෝදියස්ගේ දුව විසින් හෙරෝද් ඇන්ටිපස්ට
14. විනයධරයා විසින් ජේසුස් වහන්සේට
15. ගාබ්‍රියල් දේව දූතයා විසින් මරියතුමීට
16. සිමියොන්
17. සමාරිය
18. සකේවුස්
19. දේවාත්මානුභාවය
20. තුනකි

(ලකුණු 2X5=10)

### II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත, 2 තිමොති ලිපිය, පිලමොන් ලිපිය, කොලොස්සි ලිපිය

(ii) යාච්ඤාවේ ශුභාරංචිය, අන්‍ය ජාතිකයන්ගේ ශුභාරංචිය
දයාවේ ශුභාරංචිය, ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය
කාන්තාවන්ගේ ශුභාරංචිය, දිළින්දන්ගේ ශුභාරංචිය
කොන්වූවන්ගේ ශුභාරංචිය

(iii) ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය, රෝගීන් සුව කිරීම
දුෂ්ටාත්මයන් දුරු කිරීම, මළවුන් උත්ථානය කිරීම

(iv) 1. දේව ප්‍රසාද නිධානයකි 2. භෝජනයකි 3. යාගයකි
4. ගිවිසුමකි 5. ස්තුති කිරීමකි 6. සිහි කිරීමකි.

(v) 1. ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
2. වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම
3. ඉෂ්ට වරප්‍රසාදය ඇති ව සිටීම (පාපයෙන් තොර වීම, ඒ සඳහා පාපෝච්චාරණය කළ යුතු ය)
4. නිසි ධර්මෝපදේශයක් ලබා සූදානම් වීම
5. මෙම ප්‍රසාද නිධානය ලබා ගැනීමට ඇති ආශාව හා උනන්දුව.

(ලකුණු 4X5=20)

02. (i) ආබ්‍රහම් තුමා (ලකුණු 02)
(ii) නාතාන්/ යෙසායා/ මීකා (ලකුණු 03)
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03. (i) වඩින්නට සිටින තැනැන්වහන්සේ වූ ජේසුස් වහන්සේගේ පෙරමඟ සූදානම් කිරීම (ලකුණු 02)
(ii) ජනතාව/ අයකැමියන්/ හමුදා නිළධාරීන් (ලකුණු 03)
(iii) නැති බැරි අයට පිහිට වීම
අන් අය සමඟ බෙදා හදා ගැනීම
අන් අය වෙත බොරු චෝදනා නොනැගීම
ලද දෙයින් සතුටු වීම
තම වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම
ආදී ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ (ලකුණු 02)

(ii) මෙල්කිසදෙක්ගේ යාගය
මන්නා භෝජනය
ඉශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය
පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය (ලකුණු 03)

(iii)
- ආත්මික සූදානම යනු පාපයෙන් තොර වීම යි.
- මරණීය පාපයක් කර ඇත්නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර පාපොච්චාරණය කර ගත යුතුය
- සුළු පාපයක් කර ඇති අය දිව්‍ය පූජාව ආරම්භයේ තම පාපයන්ට මනස්තාප වී සමාව ලබා ගෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතුය.
- මරණීය පාපයක් කර ඇති කෙනෙක් දිව්‍ය පූජාවට පෙර සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අවස්ථාවක් නොමැති නම් තම පාපවලට දුක් මනස්තාප වී අවස්ථාව ලද විගස සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට සිතා ගෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත හැකි ය.
- ශාරීරික සූදානම යනුවෙන් අදහස් කරන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර අවම වශයෙන් පැයක්වත් සියලු ආහාරපානවලින් වැළකී නිරාහාරශීල ව සිටීම ය.
- තමන් කැමති නම් ඊට වඩා වැඩි කාලයක් වුව ද නිරාහාරශීල ව සිටිය හැකි ය.
- පැයක කාලය ඇතුළත ජලය හා බෙහෙත් භාවිත කිරීමට තහනමක් නැත.
- පැයක නිරාහාරශීලය රෝගී අයට මහලු අයට හා මහලු අයට උපස්ථාන කරන අයට අවශ්‍ය නොවේ.

මෙවැනි කරුණු පහක්වත් තිබිය යුතුය. (ලකුණු 05)

05. (i) අන්‍යභාෂා කතා කිරීම (ලකුණු 02)

(ii) ආත්මානුභාවය/ දේවාත්මානුභාවය/ ශුද්ධාත්මය (ලකුණු 03)

(iii) 1. තමාගේ විශ්වාසය ගැඹුරු කර ගැනීම සඳහා උන්වහන්සේ පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
2. ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ස්ථිර ප්‍රේමයක් ඇති කර ගෙන එලෙස ජීවත් වීම
3. අවශ්‍ය අවස්ථාවල දී ක්‍රිස්තු ප්‍රේමය සඳහා නැඟී සිට එයට සාක්ෂි දැරීම
4. ක්‍රිස්තුන් වහන්සේ හා එක් වී ලෝකය ශුද්ධවන්තභාවයට පත් කිරීම සඳහා සෑම උත්සාහයක් ම දැරීම
5. පරිණත කිතුනුවන් ලෙෂ වචනයෙන් සාක්ෂි දැරීම, ක්‍රියාවෙන් සාක්ෂි දැරීම. (ලකුණු 05)

06. (i) ජේසුස් වහන්සේ භෞතිස්ම ස්නාපනය ලැබූ අවස්ථාව
ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාශ වී අවස්ථාව (ලකුණු 02)

(ii) 1. "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනවැ"යි උන්වහන්සේට කීය.
2. යක්ෂයා උන්වහන්සේ උස් තැනකට පමුණුවා, ක්ෂණයකින් ලෝකයේ සියලු රට රාජ්‍යයන් උන්වහන්සේට පෙන්වා, "මේවා කෙරෙහි මුළු ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද ඔබට දෙන්නෙමි; ඒවා මට පවරා දී ඇති හෙයින් මා කැමැති කෙනෙකුට ඒවා දෙමි; එබැවින් ඔබ ම ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ම ඔබ සන්තක වන්නේ" යැයි උන්වහන්සේට කීය.
3. උන්වහන්සේ ජෙරුසලමට ගෙන ගොස්, දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න. එසේ කියන්නේ, ඔබට රැකවරණය සලසනු වස් උන්වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇතැ"යි ද යම් ලෙසකින් ඔබේ පය ගලක නොවදින පිණිස ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු ඇතැයි ද කියා ලියා ඇති බැවිනැ"යි උන්වහන්සේට කීය.
අදහස ඉස්මතු වන පරිදි තමාගේ වචනයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

***